# මගේ ලෝකය (සමස්ත ක්‍රියාවලියෙන් තොරව)

## *ප්‍රවේශය*

දර්ශන විෂයයේ මූලික ම සංවාදය ඇත්තේ ආත්මවාදය සහ අනාත්මවාදය අතර ය. භෞතිකවාදය සහ විඥානවාදය අතර ඇති සංවාදය ආත්මවාදයට කොටු වන අතර, සත්බව, ඥාන විභාගයෙන් වෙන් කරගත් ආත්මවාදීහු, මෙම සංවාදයේ පැටලී සිටිති. භෞතිකවාදය සහ විඥානවාදය අතර සංවාදය වෙනුවට, අපේ යුගයේ මූලික සංවාදය බවට ආත්මවාදය සහ අනාත්මවාදය අතර සංවාදය පත් කිරීමට හේතු වුයේ නිර්මාණාත්මක සාපේක්ෂතාවාදයයි.

නිර්මාණාත්මක සාපේක්ෂතාවාදයේ මුල් පොත වන "මගේ ලෝකයේ" ඇතුළත් සමස්ත ක්‍රියාවලිය යන සංකල්පය ඇතමුන්ට වැරැදි අවබෝධයන් ඇති වීමට හේතු විය. ඇතැම්හු යථාර්ථය යනු සමස්ත ක්‍රියාවලිය යැයි සැලකීමට පෙලඹුණ හ. සමස්ත ක්‍රියාවලිය යන සංකල්පයේ අනවශ්‍ය බව 1999 දී පළ වුණු "මගේ ලෝකයේ" තුන්වන මුද්‍රණයේ පෙරවදනේ දැක්වෙයි. සමස්ත ක්‍රියාවලිය යන සංකල්පය නොමැති ව නිර්මාණාත්මක සාපේක්ෂතාවාදය හඳුන්වා දීමට මෙහි දී උත්සාහයක් දැරෙයි. එමෙන් ම එම පෙරවදනේ දැක්වෙන ආකාරයට නිර්මාණාත්මක සාපේක්ෂතාවාදය සහ ක්වොන්ටම් භෞතිකය අතර මොනයම් ම හෝ සම්බන්ධයක් නැති බව ද මෙමගින් පෙන්වා දෙනු ලැබෙයි.

## මනස

මනස විසින් මනස නිර්මාණය කෙරෙන බව සහ එසේ සිදු වන ආකාරය නිර්මාණාත්මක සාපේක්ෂතාවාදයේ වැදගත් ම නිර්මාණයකි. මනස විසින් ම මනස නිර්මාණය කෙරෙයි. වෙනත් වචනවලින් පවසනවා නම් මනසට මනස නිර්මාණය නො කර බැරි වෙයි. එයට හේතුව මනසට මනස ගෝචර වීම වැළැක්විය නොහැකි වීමයි. කිසියම් මොහොතක සත්ත්වයකු ගේ මනස තමන් ඇති බව පිළිගත්තේ ද එතැන් පටන් කවර දා හෝ මනස නැති බව වටහාගන්නා තෙක් ම මනසට මනස අරමුණු වෙයි. මෙහි දී පළමුවෙන් ම මනස මනසට ගෝචර වූ අවස්ථාවේ එසේ ගෝචර වුයේ කෙසේ දැයි ඇසීම තේරුමක් නැති ආත්මවාදී ප්‍රශ්නයකි. යමක ආරම්භය ගැන කතා කිරීම ආත්මවාදය සමඟ ගැටගැසී තිබේ. මේ ප්‍රශ්නයට පිළිතුරක් ලෙස අපට අවශ්‍ය නම්, කොයිතරම් කාලක් (එනම් කොයි තරම් ආත්ම භවයන් ගණනක්) අතීතයට ගිය ද මනසට මනස ගෝචර වෙමින් පවතින බව පෙනේ යැයි කිව හැකි ය. එම නිසා ලෝකය ශූන්‍ය වුව ද, ලෝකය ශූන්‍ය ලෙස නො ගෙන, මනස විසින් මනස යනුවෙන් යමක් ඇතැයි ගැනීම තේරුම් ගැනීම අසීරු නො වේ.

මනසේ එක් කාර්යයක් වනුයේ දැනුම නිර්මාණය කිරීම ය. සෑම විට ම මනස තමන්ට හැකි උපරිම ලෙස සංගත වන දැනුම නිර්මාණය කර ගැනීමට උත්සාහ කරයි. හැකි උපරිම සංගත දැනුම යනුවෙන් කියැවුණ ද මනසට කිසි විටෙකත් මුළුමනින් ම සංගත දැනුමක් නිර්මාණය කළ නොහැකි වෙයි. ඒ තරම් හැකියාවක් මනසට ඇතැයි නො සිතිය යුතු ය. සංගත දැනුම නිර්මාණය කිරීම පැවැත්ම සමඟ බැඳී පවතියි. යම් දෙයක් පිළිබඳ දැනුමක් (එනම් සංගත දැනුමක්) නිර්මාණය නො කර ඊට පැවැත්මක් ලබා දිය හැකි නො වේ. මනස පෙලඹෙන්නේ යමකට පැවැත්මක් ලබා නො දී සිටීමට වඩා පැවැත්මක් ලබා දීමට ය. අල්ලාගැනීම මනසේ ස්වභාවයයි. පැවැත්මක් ලබා දුන් දෙයකට, පසු අවස්ථාවක දී ලබා දුන් පැවැත්ම අහෝසි කිරීම සිදු විය හැකි වුව ද, එසේ සිදු වන්නේ දෙවනුවයි. හැකි උපරිම සංගත දැනුම නිර්මාණයට මනස පෙලඹීමට, මෙම දැනුම සහ පැවැත්ම අතර සම්බන්ධය බලපායි. එනම් මනසේ ඇති ඇලීමේ ගතිය නිසා සිදු වන යමකට පැවැත්මක් ලබා දීමට ඇති වන පෙලඹවීම, සංගත දැනුම නිර්මාණයට පදනම සපයයි. මෙහි දී පැවැත්ම අර්බුදයට නො යන තරමේ සංගත බවක් මනසට ප්‍රමාණවත් වෙයි.

මනස විසින් අලුතෙන් නිමවෙන දැනුමට මනස විසින් ඒ වන විටත් නිමවනු ලැබ ඇති දැනුම බලපාන බව පැහැදිලි නමුත්, අලුතෙන් ඇත යැයි ගැනෙන යමක්, හුදෙක් ඒ වන විට ඇත යැයි ගෙන ඇති දේවලට ඌනනය කළ හැකි නො වේ. එනම්, මනස විසින් මේ වන විටත් අල්ලා ගෙන ඇති දේ මඟින් අපෝහනය කළ නො හැකි දේ ද, මනස විසින් අල්ලා ගනු ලබයි. නව දේ අල්ලා ගැනීමට පෘතග්ජන මනස දක්ෂ ය. මේ අදහස්වල මතුපිට ආකාරයක් ගර්ඩ්ල් ගේ අසම්පූර්ණතා ප්‍රමේයයන්හි නිරූපිත ය. මනස විසින් අල්ලා ගැනුණු යමක් සම්බන්ධයෙන් අපට උපරිම ලෙස කළ හැක්කේ, එය පරස්පරවලට තුඩු දෙයි නම් අත හැරීමටත්, එසේ නොමැති බව පෙනෙන තාක් එය පිළිගැනීමටත් ය.

යමක් පරස්පරයන්ට තුඩු දෙන බවක් පෙනෙන්නට නැත්නම් එය සත්‍ය යයි බාර ගැනීම සත්‍යය සෙවීමට ඇති එතරම් සතුටුදායක ක්‍රමයක් නම් නො වේ.

ඕනෑ ම සත්ත්වයකුට තමා සහ ඇතැම් විට තමා අවට ලෝකය පිළිබඳව සංගත දැනුමක් තිබිය යුතු වේ. එවැන්නකින් තොරව කිසිදු සත්ත්වයකුට තම පැවැත්ම සාක්ෂාත් කරගත හැකි යැයි සිතීම අසීරු ය. එවැනි අවම ප්‍රමාණයේ හෝ දැනුමක් නිර්මාණය කිරීමේ හැකියාවෙන් තොර සත්ත්වයන් නො පවතින බව සැලකිය හැකි ය. මිනිසුන් පමණක් නො ව සත්ත්වයෝ ද දැනුම නිර්මාණය කරති. සතුන්ට, මිනිසුන්ට මෙන්, චින්තනයක් නො තිබෙනවා විය හැකි ය. අද සත්ත්ව සංස්කෘති ගැන හැදෑරීමේ වෑයමක් බටහිර ජීව විද්‍යාවේ වෙයි. ඒ අනුව, චින්තනය ලෙස හඳුනාගත හැකි යමක් සතුන් සතු ව තිබේ ද යන්න සොයා බැලීම කළ නොහැකි දෙයක් නො වෙයි. යම් දෙයකට (සම්මුති අර්ථයෙන් හෝ) පැවැත්මක් ලබා දීම, නැත හොත් යම් දෙයක් වෙන් කර හඳුනාගැනීම, ඕනෑ ම සත්ත්වයකුට කළ හැකි අතර, එය දැනුම නිර්මාණයේ පුළුල් ම පදනම ලෙස සැලකිය හැකි ය.

**ඉන්ද්‍රිය**

මනසට කිසි විටෙකත් මුළුමනින් ම සංගත දැනුමක් නිර්මාණය කිරීමට නොහැකි වීමේ සහ මනස, තමන්ට සාපේක්ෂව හැකි තරම් සංගත වන තුරු දැනුම නිර්මාණය කිරීමට පෙලඹීමේ ප්‍රතිඵලය වනුයේ, මනස මනස නිර්මාණය කිරීමෙන් නො නැවතීමයි. මනස ඊළඟට නිර්මාණය කර ගන්නේ තමන් ගේ ඉන්ද්‍රිය පද්ධතියයි. දැනුම නිර්මාණය සහ කර්මය අතර සම්බන්ධයක් ඇතැයි සිතිය හැකි ය. කර්මය සහ මනස අතර සම්බන්ධයක් තිබේ. මනුෂ්‍ය ආත්මභවයක් ලබන සත්ත්වයකු සතු කිසියම් කර්ම ශක්තියක් ඇති අතර එය කිසියම් ප්‍රමාණයකට හෝ සියලු මිනිසුන් සම්බන්ධයෙන් සමාන යැයි කිව හැකි ය. ඒ හේතු කොටගෙන මිනිසුන් ලෙස ප්‍රතිසන්ධියක් ලබන සියලු දෙනාට ආසන්න ලෙස සමාන මනසක් ඇතැයි කිව හැකි ය. මෙහි ප්‍රතිඵලය වනුයේ මනුෂ්‍ය ආත්මභාවයක් ලබන සියලු දෙනා පාහේ එක ම ආකාරයක ඉන්ද්‍රිය පද්ධතියක් නිමවා ගැනීමයි. මිනිස් ආත්මභවයක ඉපදෙන අයකු වෙනත් සත්ත්වයකුට අවශ්‍ය ඉන්ද්‍රිය නිර්මාණය කර ගන්නේ නැත. ඒ අනුව සියලු මිනිසුන් ගේ මනස මෙන් ම ඔවුන් තම ඉන්ද්‍රියයන් ලෙස නිපදවන දැනුම ද එකිනෙක සම්බන්ධයෙන් ආසන්න වශයෙන් සමාන යැයි සැලකිය හැකි ය.

මිනිස් මනස කෙසේ ද යත් එය විසින් මනස පිළිබඳව නිපදවෙන දැනුම පමණක් සංගත දැනුමක් නිමවීම සඳහා ප්‍රමාණවත් වන්නේ නැත. ඇතැම් අරූපාවචර බ්‍රහ්මයන්ට මනස පිළිබඳව දැනුමක් පමණක් නිර්මාණය කර ගැනීමෙන් සංගත දැනුමක් නිර්මාණය කර ගත හැකි වනවා විය හැකි ය. එහෙත් සෑම සත්ත්වයකුට ම එසේ කළ හැකි මනසක් නැත. මිනිසුන් ගේ සහ බ්‍රහ්මයන් ගේ මනසේ ඇති මේ වෙනස් ගති සම්බන්ධයෙන් කර්මය දායක වනවා යැයි සැලකිය හැකි ය.

**සංස්කෘතිය**

මිනිස් මනසේ සහ එය විසින් නිමවෙන ඉන්ද්‍රියයන් අතර ඇති ආසන්න සමානකම නිසාත් එමෙන් ම සංස්කෘතික බලපෑම හේතුවෙන් විවිධ මිනිසුන් ගේ සිත්වල ඇතුළත් ව ඇති තොරතුරුවල (දැනුමේ) ඇති ආසන්න සමානකම නිසාත් මනස විසින් ඉන්ද්‍රිය නිමවීමෙන් අනතුරුව නිමවෙන දැනුමේ ද සමානකම් දක්නට හැකි වෙයි. මේ සියලු සමානකම් පවතින්නේ කාලයේ සහ අවකාශයේ යම් යම් පරාසයන් තුළ පමණි. එහෙත් වාස්තවික යථාර්ථයක් ගැන විශ්වාසයක් ඇති වීමට මේ එක් එක් මනසේ ඇතුළත් තොරතුරු අතර ඇති සමානකම් හේතු වෙයි. එක් එක් මනස අතර සිදු වන තොරතුරු හුවමාරුව ද ඒ ඒ මනසේ අඩංගු තොරතුරු අතර සමානත්වය වැඩි කිරීමට හේතු වෙයි.

**ද්විමය ප්‍රතිවිරුද්ධ**

මනස යම් යම් දේවලට පැවැත්මක් ලබා දෙන්නේ නැත හොත් වෙන් කර හඳුනා ගන්නේ වෙනත් දේවලට සාපේක්ෂව ය. මේ වෙනත් දේ ද මනස විසින් ම නිර්මාණය කෙරෙන දේයි. යම් දෙයක් තවත් දෙයකට සාපේක්ෂ වත් දෙවනුව කී දෙය මුල් දෙයට හෝ වෙනත් අලුත් ම දෙයකට හෝ සාපේක්ෂ වත් ඇත යැයි ගැනීම මනසින් සිදු වෙයි. යමකට පැවැත්මක් ලැබෙන්නේ අන් දේවලට සාපේක්ෂව යැයි කියැවුණ ද මෙහි දී අන් දේ යනු මුලින් කී දේ හැර සංසාරයේ ඇති සියල්ල නො වේ. යම් දෙයක් සහ එය වෙන් කර හඳුනාගැනීමට අදාළ වන අන් දේවල් ඇතුළත් සාර්වත්‍ර කුලකය මුළු සංසාරය ම නො වන අතර එය කිසියම් සන්දර්භයකට සාපේක්ෂව නිර්ණය වන සීමිත කුලකයකි. මෙම සීමිත

සාර්වත්‍ර කුලකය නිර්ණය කෙරෙන සන්දර්භය විසින් යම් දෙයක් සහ වෙනත් එක් දෙයක් පමණක් එම සීමිත සාර්වත්‍ර කුලකයට ඇතුළත් කෙරෙයි නම් එවන් අවස්ථාවල දී එම යම් දෙය සහ අනෙක් දෙය ද්විමය ප්‍රතිවිරුද්ධයන් ලෙස සැලකිය හැකි ය.

**චතුස්කෝටිකය**

නිරපේක්ෂ ලෙස ද්විමය ප්‍රතිවිරුද්ධ ලෙස පවතින දෑ නැත. එක් සන්දර්භයක ද්විමය ප්‍රතිවිරුද්ධ බවට පත් වන දේ වෙනත් සන්දර්භයක දී වෙනත් ආකාරයක් ගනී. ඇතැම් අවස්ථාවල දී ද්විමය ප්‍රතිවිරුද්ධ ලෙස ගැනෙන ප්‍රපංචයන් දෙකට ම සමාන ප්‍රපංචයන් මෙන් ම එම ද්විමය ප්‍රතිවිරුද්ධයන් දෙකට ම අසමාන ප්‍රපංචයන් ද මනසින් නිමවෙයි. චතුස්කෝටිකයේ තුන්වන සහ හතරවන අවස්ථා ද වැදගත් වන්නේ මෙහි දී ය. චතුස්කෝටිකයට අනුව එහි තුන්වන සහ හතරවන අවස්ථා (හෝ වෙනත් අවස්ථා දෙකක් හෝ) එක විට සත්‍ය වීම සිදු විය නො හැකි ය. චතුස්කෝටිකයේ තුන්වන සහ හතරවන අවස්ථා එක විට සත්‍ය වන බව පිළිගැනීමට සිදු වන අවස්ථා ද ඇතැම් විට තිබෙනවා විය හැකි ය. මේ ආකාරයට ද්විකෝටිකයෙන් චතුස්කෝටිකයට, චතුස්කෝටිකයෙන් තවත් ඔබ්බට ආදී ලෙස න්‍යාය දිගගැස්සිය හැකි වුව ද එය අවසානයක් දැකිය හැකි ක්‍රියාවක් නො වේ.

**දැනුම, අවකාශය තුළ**

එක් එක් මනසේ ඇති තොරතුරුවල සමානකම් පෙනුණ ද සියුම්ව සලකා බැලීමේ දී එක් එක් මනසේ ඇති තොරතුරුවල වෙනස්කම් ද පැහැදිලි වේ. මනසේ ගබඩා වී ඇති තොරතුරුවල එනම් මනස විසින් නිර්මාණය කෙරී ඇති දැනුමේ ඇති වැදගත් ම ලක්ෂණයක් නම් ඒ දැනුමේ යථාර්ථය යැයි ගත හැකි කිසිවක් ම නැති වීමයි. මනස විසින් ඇත යැයි ගෙන ඇති ඕනෑ ම දෙයක් සලකා බැලීමේ දී පැහැදිලි වන්නේ එය ඊට වඩා කුඩා දේවලින් නිර්මාණය වී ඇති බවයි. මෙම ක්‍රියාදාමය අවසන් වන්නේ මනසට ගත හැකි කුඩා ම දෙය හමු වීමෙනි. මනසට ගත හැකි කුඩා ම දෙයක් තිබීම මනසේ සීමා පිළිබඳ සාක්ෂියක් මිස යථාර්ථයක් තිබීම පිළිබඳ සාක්ෂියක් නො වේ. කෙනකුට යථාර්ථයක් ඇති බව නිගමනය කර ගැනීම සඳහා මනසේ සීමාවන්වලට මුවා වීමට සිදු වීම, යථාර්ථවාදයේ බංකොලොත්කම මිස අන් කිසිවක් නො වේ. මනස විසින් පවතින දෙයක් ලෙස සැලකෙන කිසි ම දෙයක් යථාර්ථය ලෙස ගත නොහැකි බව තේරුම් ගන්නා අයකු භෞතිකවාදය සහ භෞතික විද්‍යාව අතර සම්බන්ධයක් නැතැයි කල්පනා කිරීම පුදුමයක් නො වේ. එමෙන් ම විද්‍යාව එක් ප්‍රවාදයකින් තවත් ප්‍රවාදයකට මාරු වන අවස්ථාවල දී කැපී පෙනෙන විද්‍යාවේ ආත්මීයභාවය දැක ඇති භෞතිකවාදියකුට, භෞතික විද්‍යාව, නයාට අඳු කොළ මෙන් වෙයි නම් එහි ද අරුමයක් නැත. එහෙත් මේ භෞතිකවාදීන් තේරුම් නො ගන්නා කරුණ නම් අපට යථාර්ථය ලෙස ගත හැකි කිසිවක් හමු නො වන්නේ භෞතික විද්‍යාව තුළ පමණක් නො වන බවයි. අපට භෞතික විද්‍යාව පමණක් නො ව වෙනත් විද්‍යාවක් හරහා වුව ද ලැබෙන කිසිදු දැනුමක යථාර්ථයක් අඩංගු නො වේ.

**දැනුම කාලය තුළ**

මනසට ගත හැකි කුඩා ම දෙය හමු වන්නේ, මනස විසින් ඇත යැයි ගනු ලබන දේ අවකාශය අනුබද්ධයෙන් විමසීමේ දී ය. මේ ආකාරයට මනස විසින් ඇත යැයි ගනු ලබන දේ කාලය අනුබද්ධයෙන් ද විමසිය හැකි ය. එහි දී සලකා බැලෙන්නේ මනස විසින් ඇත යැයි ගනු ලබන දේවල සිදු වන වෙනස් වීමයි. මනස විසින් ඇත යැයි ගනු ලබන ඕනෑ ම දෙයක් අඛණ්ඩව වෙනස් වෙයි. එහි දී යමක් වෙනස් නො වී පවතින කුඩා ම කාල ප්‍රාන්තරයක් වෙයි නම්, ඒ කාල ප්‍රාන්තරය, මනසට ගත හැකි කුඩා ම කාල ප්‍රාන්තරය වෙයි. එසේ මනසට ගත හැකි කුඩා ම කාල ප්‍රාන්තරයක් තිබීම මනසේ ම සීමා පිළිබඳ සාක්ෂියක් මිස වෙනස් නො වන යමක් ඇති බවට සාක්ෂියක් නො වේ. සියල්ල වෙනස් වන බවත් පවතින දෙයක් ලෙස සැලකිය හැකි කිසිවක් නොමැති බවත් වටහා ගන්නා අයකු යථාර්ථය යනු අනිත්‍යය විය යුතු යැයි කල්පනා කිරීමට ඇතැම් විට පෙළඹෙනවා දැකිය හැකි ය. මෙහි දී කිව යුත්තේ, අනිත්‍යය යථාර්ථය ලෙස සැලකීම, අනිත්‍යය අවබෝධ වී නොමැති බව නම් පෙන්නුම් කරන බවයි.

**යථාර්ථවාදයේ අර්බුදය**

මනස විසින් කෙළවරක් නැති ව දැනුම නිර්මාණය කෙරුණත් යථාර්ථය ලෙස ගෙන හැර දැක්විය හැකි දැනුමක් නිර්මාණය කර නො තිබීම සැඟවීම සඳහා, ලෝකය පිළිබඳව දැනගෙන අවසාන කළ නොහැකි යැයි කීමට ඇතැම් භෞතිකවාදීහු පුරුදු ව සිටිති. මේ අය තේරුම් නො ගන්නා කරුණ නම් ලෝකය පිළිබඳව යළි වෙනස් කිරීමට නො

සිදු වන බවට සහතික කළ හැකි දැනුමක් නොමැති ව ලෝකය පිළිබඳව දැනුම නිර්මාණය කර අවසන් කළ නොහැකි යැයි කියා ප්‍රශ්නයෙන් ගැලවිය නොහැකි බවයි. අපට යථාර්ථයක් ලෙස පෙන්විය හැකි දැනුමක් නැති නම් ඉන් කියැවෙන්නේ යථාර්ථයක් ලෙස යමක් තිබුණත් එය අපට දැනගත නොහැකි බව මිස අන් යමක් නො වේ. යථාර්ථවාදයේ මූලික ම අර්බුදය හමු වන්නේ එය කුමක් දැයි කීමට යාමේ දී ය. ඒ බව හෙළිදරව් කිරීමට හැකි වීම නිර්මාණාත්මක සාපේක්ෂතාවාදයේ විශිෂ්ට ජයග්‍රහණයක් වෙයි. යථාර්ථවාදීන්ට එක්කෝ කිව හැක්කේ යථාර්ථයක් ඇතත් අපට එය දැනගත නොහැකි බවයි. නැතිනම් අප යථාර්ථය කුමක් දැයි දැනට නො දන්නා මුත් එය වෙත ආසන්න වෙමින් සිටින බවයි. තමන් දැනටමත් යථාර්ථය දන්නා බව කියන යථාර්ථවාදියකු ගැන නම් අපි තවම නො දනිමු. යථාර්ථයක් ඇතත් එය දැනගත නොහැකි යැයි ද, අපට විද්‍යමාන වන ලෝකය යථාර්ථය නො වුව ද එය අපට නො පෙනෙන යථාර්ථය විසින් ජනිත කෙරෙන්නේ යැයි ද පවසන අයට යථාර්ථය සහ අප අත්දකින ලෝකය අතර සම්බන්ධය සංයුක්තව තේරුම් කර දිය හැකි නො වේ. එසේ තිබිය දී එනම් යථාර්ථය සත්‍යේක්ෂණයට ලක් කළ නොහැකි ව තිබිය දී යථාර්ථයක් ගැන විශ්වාස කිරීම හුදු ඇදහිල්ලකට වඩා වෙනස් නො වේ.

මීට වඩා වෙනස් ව, යථාර්ථය දැනගත හැකි යැයි කියන අය, යථාර්ථය දැනගන්නට යන්නේ මනසින් ය. යථාර්ථය දැනගන්නේ මනසින් නම්, යථාර්ථය ලෙස මනසට සාපේක්ෂ යමක් ගැනීම වැළැක්විය හැකි නො වේ. යථාර්ථය අවබෝධ කර ගන්නේ මනසින් නිසා, යථාර්ථය දැනගත හැකි යැයි කී විට ඉන් කියැවෙන්නේ, යථාර්ථය පිළිබඳව මනසට සාපේක්ෂ නො වන දැනුමක් ඇති කරගත නො හැකි බව මිස අන් යමක් නො වේ.

භෞතිකවාදීන්ට අනුව අප වඩ වඩාත් සංගත දැනුම නිර්මාණය කරමින් කරනුයේ සත්‍යයට ක්‍රමයෙන් ආසන්න වීමයි. අප සත්‍යයට ආසන්න වනවා යැයි කීම සඳහා ලෝකය පිළිබඳව අපට නිර්මාණය කිරීමට ඇති දැනුම පරිමිත යැයි කිව හැකි විය යුතු වෙයි. එසේ සලකන අය, අපට කවර දා හෝ තියරි ඔෆ් එව්රිතිංග් ලෙස හැඳින්වෙන සියල්ල පැහැදිලි කළ හැකි න්‍යායක් හමු වනු ඇතැයි ද එදාට විද්‍යාව අවසන් වනු ඇතැයි ද විශ්වාස කරති. (තියරි ඔෆ් එව්රිතිංග් යන්න නිර්මාණාත්මක සාපේක්ෂතාවාදයට අනුව විකාරයකි. අපට කිසි දිනෙක මුළුමනින් වියුක්ත දැනුමක් නිපදවිය නොහැකි ය). නිවැරැදි යැයි කිව හැකි එක ම දැනුමක් හෝ නිපදවා නැති විද්‍යාව, එක් වර ම සියල්ල පැහැදිලි කරන න්‍යාය නිර්මාණය කර, තම කාර්යභාරය අවසන් කරනු ඇතැයි ඇදහීම, ආගමික විශ්වාසයකට වඩා දෙවෙනි නො වේ. අනෙක් අතට, ලෝකය පිළිබඳව නිර්මාණය කිරීමට ඇති දැනුම අපරිමිත නම්, දැනට යථාර්ථය ලෙස සැලකිය හැකි දැනුමක් නිර්මාණය කර තිබෙන්නේ වුව ද, අපට සත්‍යයට ආසන්න වනවා යැයි කිව හැකි නො වේ. අනන්තය බලා යන පුද්ගලයකු, කෙතරම් දුර ගියත්, සෑම විට ම යා යුතු තැනට වඩා අනන්ත දුරක් ඇතින් සිටියි.

**නිවන**

මේ සියලු ගැටලු විසඳීමට ඇත්තේ එක් මගකි. එනම් අපට පරමාර්ථ සත්‍යය කුමක් ද යන්න අවබෝධ කරගත හැක්කේ ඒ සඳහා මනස මැදිහත් නො වන ආකාරයකට කටයුතු කිරීමෙන් බව පැවසීමෙනුයි. එහි දී මනස නැති බව වටහා ගැනීම ප්‍රධාන වෙයි. මින් එහාට කිව යුතු දේ "මගේ ලෝකයෙන්", එහි තුන්වන මුද්‍රණයේ පෙරවදනේත්, බුද්ධ දේශනාවේත්, ඇතුළත් නිසා මෙහි කිසිවක් නො ලියමු.

මනසින් තොර ව යථාර්ථයක් ඇතැයි සිතීම, එහෙත් එවැන්නක් ඇති බව මනසින් තොර ව පෙන්වා දිය නො හැකි වීම, ලෝකය අපට දැන ගත හැකි යැයි කීම, එහෙත් දැනගත් දෙයක් නො තිබීම, යථාර්ථය අපෙන් ස්වායත්ත යැයි සැලකීම, එහෙත් යථාර්ථය ලෙස මනසට සාපේක්ෂ දෙයක් ගැනීමට සිදුවීම, ආදි ලෙස ඇති විසංවාදී මඩ ගොහොරුවේ පිපුණු සියපතක් සේ නිර්මාණාත්මක සාපේක්ෂතාවාදය බැබළෙයි.

**කථිකාචාර්ය නාරද වික්‍රමගේ**